# සැවුල් මිනිස් සබැඳියාව

**අරුණ පද්මපෙරුම,**
**සාන්ත උදය කුමාර**
**ශ්‍රී ලංකා ක්ෂේත්‍ර පක්ෂි විද්‍යා කවය**

වන දිවි අතහැර පෙරට එන විට මිනිසා සමග පැමිණ නේවාසික වූ සතුන් රාශියකි. කුකුළා ඒ අතර ඉදිරියෙන් සිටියි. සැවුල් මිනිස් ඇසුරට ඉතිහාස ගමන් මගෙහි විශේෂත්වයක් ලැබී ඇත. ලංකාව, ඉන්දියාව වැනි ආසියාතික රට වල මිනිසා හා කුකුළා අතර ඇත්තේ වෙසෙස් සබැඳියාවකි.

විවිධ ස්වරූපයෙන් මෙම සබඳතාවය තහවුරු වී තිබේ. එය අප රටට අදාල වන අවස්ථා කිහිපයක් මෙසේ දැක්විය හැකිය.

1 සංස්කෘතික උරුමයක් වීම
2 හෝරා සංකේතයක් වීම
3 ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වීම
4 ජය සංකේතයක් වීම
5 සටන්කාමී ජීවියෙක් වීම
6 ක්‍රියාශීලී ජීවියෙක් වීම
7 පරිසරයේ තුලනාත්මක බව පවත්වාගෙන යාමට දායක වීම
8 දැකුම්කලු ජීවියෙක් වීම
9 සන්නිවේදන කාරකයකු වීම
10 භාෂාව හා සාහිත්‍ය පෝෂණය කිරීමට නිමිත්තක් වීම

අනාදිමත් කාලයක සිට කිසියම් ජන කණ්ඩායමක් විසින් පවත්වාගෙන එන සිරිත්-විරිත්, ඇවතුම්-පැවතුම්, ආගම-දහම, වත්-පිළිවෙත් යනාදිය සංස්කෘතිය යන වචනයෙන් ආවරණය කෙරේ.

ලාංකික ගැමියෝ යමෙක් රෝගාතුර වූ කල ඔහු හෝ ඇය සුවපත් කිරීමට තොවිල්-පවිල් ආදිය කිරීමට යොමු වේ. රෝගයට මුල් වූ යක්ෂයන් හා ප්‍රේතයන් සතුටු කොට උන් ලවා රෝගය ඉවත් කර ගැනීම එහි අභිලාෂයයි. මේ අනුව සිදු කරන ශාන්ති කර්ම වලදී කුකුළාට විශේෂ තැනක් හිමි වේ. ආතුරයාට විනකළ යකු සතුටු කිරීමට කැප කළ යුතු හා දිය යුතු දොල-පිදේනි වලට අනිවාර්යයෙන්ම කුකුළෙකු සිටිය යුතුය. රෝගියා අත හැර කුකුළාව රැගෙන යක්ෂයා ඉවත් වන බව ගැමියන්ගේ විශ්වාසයයි. මෙම ශාන්ති කර්ම අවස්ථා අතර කුකුළු පාලිය නම් වූ විශේෂ අංගයක් ද තිබේ. එය ආරම්භ වන්නේ කුකුළු උපත පිළිබඳ කවි ගායනා කිරීමෙනි.

| | |
|---|---|
| පෙර සිට කුකුළා පැවතයි | එන්නේ |
| උඩ සිට බැල්මෙනි අහුලා | කන්නේ |
| යකා මෙතන කළ ලෙඩ දුර | ලන්නේ |
| බිල්ලේ පාලියට සන්නිය | එන්නේ |

සුභ ගමනක් යන විට කුකුළෙකු හමුවීම හෝ කුකුළෙකු හැඬලීම නිසා තමා යන ගමන සඵල වන බව ගැමියන්ගේ විශ්වාසයයි. එසේම අභිනවයෙන් ඉදි කළ ගෙදරක සවිකළ උළුවස්සෙන් පළමුව කුකුළකු පැන්නවීමෙන් වස්-දොස් දුරු වන බව ගැමියන් අතර ප්‍රචලිත මතයකි. එපමණක් නොව සම්ප්‍රදාය ගරු කරමින් මංගල අවස්ථාවන්හි දල්වන පොල්තෙල් පහන මුදුනෙහි විරාජමාන වීමටද කුකුළා සමත් වී තිබේ. කුකුළා සතු උතුම් ගුණාංග සලකා බලා ඔහුට නිසි තැන දීමට ලාංකිකයන් සමත්ව ඇති බව ඉන් පැහැදිලිය.

කුකුළාගේ නාදය හෝරා සංකේතයක් ලෙස පිළිගැනීම එදා සිට අද දක්වා කෙරෙන්නෙකි. ගැමි නිවසක, හේනේ පැලක, ආදිවාසී ජන සමාජයක ඔරලෝසුවේ මෙහෙවර කුකුළාගේ හැඬලීමෙන් ලබා ගනී. මෙම පක්ෂියාගේ හැඬලීම දවසක ආරම්භය විය. කුකුළා මුලින්ම හඬලන්නේ අලුයම 3.30 ට පමණය. අනතුරුව පැය භාගයෙන් භාගයට නාද කරයි. මෙම නාදය සක්‍රීය සමාජයකට අඩිතාලම දමයි. අවදිවීම, ගමන්-බිමන් සඳහා පිටත් වීම, කුඹුරට යාම වැනි කටයුතු නිදසුන් කිහිපයකි.

වහල් යුගයේදී ඇතැම් වහල් හිමියන් කුකුළන් බලහත්කාරයෙන් හඬලවා අලුයම සිට වහලුන්ගෙන් වැඩගත් බව පොත-පතේ සඳහන් වී තිබේ.

ජාතිය නියෝජනය කරන සංකේත අතරට කුකුළා යොදා ගැනීම තවත් වැදගත් සිදුවීමකි. ජාතික පක්ෂියා වශයෙන් යෝජනා සම්මත කිරීමට පෙර කරුණු-කාරණා ගණනාවක් පිළිබඳ සොයාබලා ඇත. අප රටට තැන්වැති (ආවේණික) වීම, රට පුරාම පැතිර පැවතීම, පරිනාමිකව පැරණි ජීවියෙක් වීම, වාසනාවේ සංකේතයක් වීම යන කරුණු වලට විශේෂ අවධානය යොමු කර තිබේ. එදා සිට අද දක්වාම ගැමි ජනතාව අතර මෙම කුරුල්ලාට හිමිව පැවති සැලකිල්ල සලකා බලා ශ්‍රී ලංකා වලි කුකුළා අප රටෙහි ජාතික පක්ෂියා ලෙස නම් කර තිබේ.

ක්‍රියාශීලි ජීවීන් අතරින් පෙරමුණ ලැබෙන්නේ කුකුළාටය. ඌරෙකු සේ හෝ ගවයෙකු සේ හෝ වැතිර ලැගීමක් නොමැති ජීවියෙකි. කෙතරම් අසීරුතා හමුවේ වුවද ප්‍රබෝධයෙන් හැසිරීම මෙම පක්ෂියා තුළ දකින වෙසෙස් ලකුණකි. සටන්කාමී බවත්, ජයග්‍රාහී බවත්, ක්‍රියාශීලී ස්වභාවයත් ජීවියෙකුට උපතින්ම හිමි දායාදයන් වේ. පරාජය අමතක කර මරණය දක්වාම එල්ලීගෙන සටන් කිරීමට මහඟු හැකියාවක් කුකුළාට ඇත. විදේශ ආක්‍රමණ වලින් පීඩිතව සිටි මෙරට ජනතාව මෙම පක්ෂියාගේ චර්යාව තුළින් කිසියම් හෝ ආභාසයක් තම විමුක්ති අරගල වලදී ලබාගත් බව පැවසීම යුක්ති සහගතය.

යුද්ධයට යන රජ කෙනෙක් හෝ හමුදා සංවිධානය කරන සෙන්පතියෙක්, කුකුළාගේ ජය ඝෝෂාව පෙරමගට බලාපොරොත්තු වූ බව ජනශ්‍රැතියේ කියවේ. සටනකින් ජය ගෙන, හඬලන කුකුළාගේ නාදය ඇසීමට හැකිවුවහොත්, කිරීමට අර අඳින ක්‍රියාව මල්ඵල ගන්නා බව එදා මෙන් අදත් පවතින විශ්වාසයකි. කුකුළන් ඇති කිරීම, සටනට පුරුදු කිරීම, පොර කෙටවීම යනාදිය ඇතැම් සමාජ කණ්ඩායම් උදෙසා උපතින්ම ලැබුණු ආත්මීය රැකියාවන් බව ජනශ්‍රැතියේ සඳහන් වේ.

ජන සාහිත්‍යයේ පණිවිඩ ගෙනයන්නෙකු (දූතයෙකු) ලෙස කුකුළාගේ චරිතය ප්‍රධාන වී තිබේ. භාෂාව හා සාහිත්‍යය පෝෂණය

කිරීමෙහි ලා කුකුළා නිමිතිකර ගැනීම තවත් විශේෂ කරුණකි. කළයුතු කාර්යය පසෙක තිබියදී එය අමතක වූවා සේ ව්‍යාජ ලෙස හැසිරෙන අයෙකු දුටු කල හොර ගල් අහුලන්නේ මන්දැයි විමසා සිටි. මේ හොරගල් ඇහිලීම ජනවහරට මුසු වී ඇත්තේ පොර කුකුළන්ගේ හැසිරීම මුල් වීමෙනි. ඇතැම් පොර කුකුළන් පොර අල්ලන අතරේදී හිටි හැටියේම එය නතර කර, බිම ඇති දෑ අහුලන බව ඇඟවීම එම චර්යාවයි.

එසේම සංදේශ කාව්‍යයෙහි පරිසර වර්ණනා කිරීම් වලදී බොහෝ සාහිත්‍යකරුවන් මෙම පක්ෂියා අමතක කර නැත.

සීතාකවක පුර යුගයේ විසූ අලගියවන්න මෙහොට්ටාලයෝ කුකුළා දූතයා කර ගෙන සංදේශ කාව්‍යයක් සැවුල් සංදේශය නමින් රචනා කළෝය. සැවුල් සන්දේශයේ දූතාශිර්වාදයේ සඳහන් කවියක සැවුලා ගැන උදම් අනා ඇති ආකාරය පහතින් දක්වා ඇත.

| | |
|---|---|
| සැරද සැවුලිඳු | සඳ |
| රත මිණි සදිසි සිළු | යුත් |
| දිමුතු මුතු | කලඹෙව් |
| පළ හෙළ පියපතර | සඳි |

හිරු බැස යන කල්හි රැය ගත කිරීමට කුකුළන් ගස් උඩට නගින අයුරු දුටු හංස සංදේශකරු එය පවසන්නේ මෙසේය.

| | |
|---|---|
| හැමතැන කරන මුනි පුද නරඹන | ලෙසට |
| තැන තැන සැවුල් ගණ පැමිණෙති තුරු | සිරට |

හෙළ සාහිත්‍යයේ කුකුළාගේ නියෝජනය යම් සේද අභිචාර සිරිත්-විරිත් ආදියට ද කුකුළා සමීප වී ඇත්තේ ඊට නො දෙවෙනි අන්දමිනි.

දැඩිමුණ්ඩ දෙවියන්ගේ වාහනය ලෙසත් කතරගම දෙවියන්ගේ ධජයේ ලාංඡනය ලෙසත් කුකුළා ගෞරවයට පාත්‍ර වී ඇත. රැයිපියල් තෙන්නකෝන්ගේ කුකුළු හැවිල්ල නම් පැදි පෙලෙහි තම කුකුළා විනාශ කිරීමේ පාඩුව කතරගම දෙවියන්ට බලපාන බව මෙසේ පැවසේ.

| | |
|---|---|
| මගේ කුකුළා නැසූ | එකා |
| ධජය ඔබගේ පාලු | යකා |

මීට අමතරව ජන වහරේ පවතින උපහැරණ ගණනාවක් සඳහාද කුකුළා ඉවහල් කරගෙන තිබේ.

- කුකුළු කේන්තිය වාගේ
- නරියට කුකුළන් බාර දුන්නා වාගේ
- කිකිළි තාරා බිත්තර රැක්කා වගේ
- තෙම්ච්ච කුකුළට සීත නැතිලු
- මරාපු කුකුළා සුද්ද කරන්න නරියට දුන්නා වගේ
- කුකුළු නින්ද වගේ

මෙසේ කට වහරේ පමණක් නොව ලිඛිත සාහිත්‍යයේද කුකුළා තීරණාත්මක සතෙකි. බෝසතුන් මහෝෂධ පඬිතුමා ලෙසින් උපන් සමය ගැන විස්තරාත්මක වන උමංදාවේ ද කුකුළා ගැන රසවත් කතාවක් ලියැවී තිබේ. ඒ වේදේහ රජු ඉදිරිපත් කළ කුක්කුට ප්‍රශ්නයයි. එය ලුහුඩින් මෙසේය.

මුළු සිරුරම සුදු පැහැ වූ, පාවල අං ඇති හිසෙහි මොල්ලියක්



Sri Lanka Jungle Fowl

ඇති කාලාත්‍රය නොවරදවා නාද කරන ගවයෙක් රැගෙන එව. යනුවෙන් මහඔසු පඬිවරයා යවමැදුම් ගමට ආඥාවක් නිකුත් කරයි. එය නොගෙනාවහොත් මසුරන් දහසක දඩයකි.

සැබෑවටම මේ නම් අප නොඇසූ ගවයෙකි. නොදුටු විරූ ගවයෙකි. එහෙත් පඬිතුමාට එය එතරම් පැනයක් නොවීය.

සුළු මොහොතකින් මහෝෂධ පඬිතුමා සුදු පැහැති කුකුළෙකු රජතුමා වෙත යැවීය. රජතුමාගේ තේරවිල්ලේ පිළිතුර එයයි. පාවල අං යනු පොරකටුය. හිස මොල්ලිය යනු හිස් මල නැතිනම් කරමලයි. කාලාත්‍රය නොවරදවා හැඬලීම යනු මාත්‍රා නිසිලෙස හැඬලීමය. කෙටි හැඬලීම, මධ්‍ය ප්‍රමාණයේ හැඩලීම, දීර්ඝ වේලාවක් එක ලෙස හැඬලීම, හෙවත් ලඝු, ගුරු, ප්ලුත යන මාත්‍ර දැනගෙන හැඬලීම කාලාත්‍රය වේ. මෙම ලක්ෂණ තුනෙන් සමන්විත වූ ධවල ගොනා නම් සුදු කුකුළාය.

මළහිරු බැස යන සැඳෑවක ගසක අත්තක ලගිමින් හඬලන කුකුළන් තවත් දිනයක ප්‍රභාතයේදී නැවතත් නාද කරමින් දින, සති, මාස උදා කරයි. මෙම අපූරු ජීවියාගේ චර්යා රටා නිරීක්ෂණය කරමින් ජනශ්‍රැතියේ සුවිශාල පරිච්ඡේදයක් සැකසී තිබේ. එම විශාල තොරතුරු සම්භාරයෙන් ස්වල්පයක් ගෙන රචිත මෙම මාතෘකාව ඔස්සේ තවදුරටත් ගමන් කිරීමට පාඨක ඔබ තුළ වෙරක් ඇති කරමින් ලිපිය අවසන් කරමු.